මාධ්‍ය නිවේදනය

2018 මාර්තු 08, කොළඹදී...

Nestlé
Good Food, Good Life

# අතුරුපස වඩාත් රසවත් කරවන මිල්ක්මේඩ් චොකෝ ටොපින් දැන් නෙස්ලේ නිවසින්...

අතුරුපස ලෝකයේ ජනප්‍රිය නාමයක් වන මිල්ක්මේඩ්, අතුරුපස ලෝලීන් වෙනුවෙන්ම මිල්ක්මේඩ් චොකෝ ටොපින් (*Milkmaid Choco Topping*) නමින් නව නිෂ්පාදනයක් පසුගියදා හඳුන්වාදුනි. මෙම නව නිෂ්පාදනයේත් මිල්ක්මේඩ් රසිකයින්ට සුපුරුදු කිරි රසය පිරිනමන්නේ චොක්ලට් සෝස් හා හේසල් නට් රසය ද එක් කරගනිමිනි.

සාමාන්‍ය ආහාරයක් අති විශේෂ අතුරුපසක් බවට බොහොම පහසුවෙන් පත්කිරීමේ හැකියාව මිල්ක්මේඩ් චොකෝ ටොපින් සතුවීම කැපීපෙනේ. රසවත් බව මෙන්ම විවිධත්වයකින් යුතුව භාවිතා කළ හැකි නිසා අයිස්ක්‍රීම්, වොෆල්ස්, පැන්කේක්, මිල්ක්ෂේක් වැනි ආහාරපාන සැකසීම සඳහා මෙන්ම පාන් මත තවරා ආහාරයට ගැනීමටත් පළතුරු ආහාරයට ගැනීමටත් මිල්ක්මේඩ් චොකෝ ටොපින් යොදාගත හැකිවීම විශේෂත්වයකි.

නෙස්ලේ සමාගමේ කිරි අංශයේ උප සභාපති රුවන් වැලිකල මහතා අදහස් දක්වමින් මෙසේ පැවසීය. "මිල්ක්මේඩ් සැමවිටම තමන් කැමැති අතුරුපස වර්ග රසවිඳීම සඳහා පාරිභෝගිකයන්ට සහාය වූවා. ඕනෑම සූපවේදියෙකු තමන් සාදන අතුරුපස අලංකාර සෝස් වර්ගයකින් සැරසීමට සැළකිලිමත් වෙනවා. අපගේ මිල්ක්මේඩ් රසිකයින්ටත් ඒ අයුරින් තමන්ගේ අතුරුපස වැඩිදියුණු කිරීමට සහාය වීම අපගේ අරමුණයි. හොඳ පෙනුමකුත් නැවුම් රසයකුත් ඇති සාමාන්‍ය සහ සරල අතුරුපස වර්ග ඉතා විශේෂ අතුරුපසක් බවට පත්කිරීමට මිල්ක්මේඩ් චොකෝ ටොපින් දායක වනු දැකීම අපට විශාල සතුටක්".

ඉතා සුමට බවින් යුත් නිවසේදීම තැනූ චොක්ලට් සෝස් මෙන් රසවත් මිල්ක්මේඩ් චොකෝ ටොපින්, නෙස්ලේ සමාගම සතු ලොව උසස්ම ආහාර තාක්ෂණ විශිෂ්ටත්වයත්, සුප්‍රකට සූපවේදීන්ගේ ඉවුම් පිහුම් දක්ෂතාත් තුළින් හොඳම වට්ටෝරුවක් අනුව වැඩිදියුණු කරන ලද්දකි.

නෙස්ලේ සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂිකා ෂිවානි හෙග්ඩේ මහත්මිය නව නිෂ්පාදනය පිළිබඳව මෙසේ අදහස් පළකළාය. "විවිධත්වය තුළින් ආහාරයේ සතුට වැඩිවන බව අපගේ දැඩි විශ්වාසයයි. නෙස්ලේ සමාගම, සමබල ආහාරයක් තුළ විවිධත්වය සැපයීමේ හැකියාව සහිත සුවිශේෂ ආයතනයක්. දවසේ සෑම මොහොතක් සඳහාම, සෑම ආහාර අවස්ථාවකටම, පවුලේ සෑම දෙනෙක් වෙනුවෙන්ම තෝරාගැනීම් රැසක් අපගේ නිෂ්පාදන එකතුව තුළ පවතිනවා. මිල්ක්මේඩ් පරම්පරා ගණනාවක් තිස්සේ විවිධත්වය සහිත අතුරුපස අමුද්‍රව්‍යයක් ලෙස ප්‍රසිද්ධියට පත්ව තිබෙනවා. මිල්ක්මේඩ් චොකෝ ටොපින් සමඟ අපගේ පාරිභෝගිකයන්ට තමන්ගේ අතුරුපස සමඟින් ආහාරවේල වැඩිදියුණු කරගැනීමට දායක වීම ගැන අප මහත් සතුටට පත්වෙනවා".

ක්‍රීම්බවින් සහ ප්‍රනීත රසයෙන් යුතු මිල්ක්මේඩ් නිපදවන්නේ, ශ්‍රී ලාංකික කිරිගොවීන් සිය දහස් ගණනකගේ දායකත්වයෙන් හා රට පුරා විසිරුණු තණ බිම්වලින් සපයා ගැනෙන නැවුම් කිරි යහගුණයෙනි. ලොව පුරා ප්‍රසිද්ධිය පත් නෙස්ලේහි උසස් තත්ත්ව ප්‍රමිතීන්ට යටත්ව කුරුණෑගල පිහිටි නෙස්ලේ අති නවීන කර්මාන්තශාලා පරිශ්‍රයේදී මිල්ක්මේඩ් නිෂ්පාදනය කෙරේ.

---